ඉදිරියේ මෙකී කටයුතු මෙම වේගයෙන්ම පවත්වා ගැනීම ගැටළුවක් විය හැකිය. මෙම තත්ත්වය යටතේ පසුතල සංවර්ධන වියදම් සහ නිෂ්පාදනය මූලික කර ගත් ආයෝජනයන් අතර මනා තුලනතාවයක් පවත්වා ගැනීමේ අවශ්‍යතාවය ඉස්මතු වී පෙනේ.

**1·21 සංඛ්‍යා සටහන**

**රාජ්‍ය අංශයේ නිවාස යෝජනා ක්‍රම**
**(1980 දෙසැම්බර් මස අවසාන වන විට ප්‍රගතිය)**

| යෝජනා ක්‍රමය | ඉලක්ක කර ඇති ඒකක ගණන | ඇස්තමේන්තු ගත මුළු වියදම රු. ද. ල. | සම්පූර්ණ කරන ලද ඒකක ගණන | ඉදිවෙමින් පවත්නා ඒකක ගණන | සමුච්චිත මුළු වියදම රු. ද. ල. (අ) |
|---|---|---|---|---|---|
| 1. සෘජු ඉදි කිරීම් .. | 36,000 | 4,608·8 | 5,797 | 16,750 | 1,230·3 |
| 2. අත්තම් නිවාස ක්‍රමය .. | 50,000 | 779·8 | 8,699 | 17,746 | 313·0 |
| 2·1 අත්තම් නිවාස .. | — | (100 0) | 3,606 | 13,492 | — |
| 2·2 ආදර්ශ ගම්මාන .. | — | — | 4,838 | 2,871 | — |
| 2·3 ධීවර නිවාස .. | — | — | 255 | 1,383 | — |
| 3. මැතිවරණ කොට්ඨාශ බද නිවාස .. | 26,040 | 760·0 | 5,880 | 5,040 | 238·0 |
| 3·1 සෘජු ඉදි කිරීම් ක්‍රමයට අනුව .. | 5,880 | 256·0 | — | — | — |
| 3·2 අත්තම් නිවාස ක්‍රමයට අනුව .. | 20,160 | 504·0 | — | — | — |
| 4. රජයේ සේවක නිල නිවාස . | 695 | 88·0 | ලැ·නො· | ලැ·නො· | 70·0 |
| 5. මුඩුක්කු හා පැල්පත් නගාලීම .. | 5,839 | 55·0 | 465 | ලැ·නො· | 0·2 |
| 6. ජාතික නිවාස අරමුදලේ ණය .. | 14,000 | ලැ. නො. | ලැ·නො· | ලැ·නො· | 130·0 |

(අ) තාවකාලික

මූලයන්: ජාතික නිවාස සංවර්ධන අධිකාරිය; නාගරික සංවර්ධන අධිකාරිය; පලාත් පාලන, නිවාස හා ඉදි කිරීම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

## සේවා නියුක්තිය

දියුණු වෙමින් පවත්නා රටක ජනතාවගේ ජීවන තත්වය නංවාලීම සඳහා වඩාත්ම ප්‍රතිඵල දායක කෙටිකාලීන උපාය මාර්ගය ලෙස සැළකිය හැක්කේ ශ්‍රමය යොදවා ගැනීමට හා ශ්‍රමයෙහි ඵලදායකත්වය වැඩි දියුණු කරලීමට ඉවහල් වන අන්දමේ ආයෝජන සහ නිෂ්පාදන ක්‍රියාමාර්ග යොද ගැනීමය. මෙම අර්ථයෙන් බලන විට, 1977 අග භාගයේ දී හඳුන්වා දෙනලද ප්‍රතිපත්ති වල වඩාත්ම හිතකර ප්‍රතිඵලය වූයේ ආර්ථිකයේ අංශ රැසකම ආදයම් ඉපැයිය හැකි අලුත් රැකියාවන් විශාල සංඛ්‍යාවන් උත්පාදනය වීමය.

1978 – 80 තුන් අවුරුදු කාලසීමාව තුළ දී ආර්ථිකයේ සංවිධානාත්මක අංශය තුළ ඇතිවූ නව රැකියා අවස්ථාවන්ගේ මුළු ගණන 278,035 ක් වූ අතර, මේ නිසා සේවා වියුක්ති අනුපාතය සියයට 15 පමණ දක්වා අඩු කරලීමට ද හැකිවිය. එසේ වුව ද, රැකියා බලාපොරොත්තුවෙන්, වසරක් පාසා ශ්‍රමබලකායට අලුතින් ඇතුල් වෙතැයි ඇස්තමේන්තු කර ඇති 125,000 දෙනාගේ වැඩිවීමත් සමග සසඳා බලන විට, සේවා වියුක්ති ජන සංඛ්‍යාව ඉහළ නැගීම වළකාලීම සඳහා රැකියා අවස්ථාවන් සැපයීම වඩාත් සීඝ්‍ර අනුපාතයකින් සිදුකල යුතුව ඇති බව පෙනී යයි. කෙසේ වුව ද, සංවිධානාත්මක නොවූ අංශයන්හි සේවා නියුක්තිය ඉහත කී සංඛ්‍යාවලට ඇතුලත් වී නැත. 1978 – 80 තුන් අවුරුදු කාලසීමාව තුළදී රැකියා අවස්ථා ලබාදෙන ලද මුළු

සංඛ්‍යාව සමස්තයක් ලෙස ගත් කල ඉහළ ප්‍රමාණයක් වුව ද, 1980 දී විශේෂයෙන්ම, සංවිධානාත්මක අංශය තුළ රැකියා ඇති කිරීමේ අනුපාතය පැහැදිළි ලෙස අඩු වී ඇත. 1978 හා 1979 අවුරුදුවල දී පිළිවෙලින් 145,000 සහ 115,000 ක් වූ නව සේවා නියුක්ති අවස්ථාවන් සමග සසඳා බලන විට, 1980 දී ආණ්ඩුවේ දෙපාර්තමේන්තු අර්ධ – රාජ්‍ය සංස්ථා සහ අනෙකුත් සංවිධානාත්මක (එනම්, සේවක අර්ථසාධක අරමුදලට දායක වන) පෞද්ගලික අංශයේ ව්‍යාපාර ආයතන ආදිය මගින් සපයන ලද රැකියාවන් ප්‍රමාණය වූයේ 18,035 ක් පමණි. කෙසේ වුව ද, මෙම ප්‍රමාණය තුළ, සංවිධානාත්මක නොවූ පෞද්ගලික අංශයේ සහ සම්ප්‍රදායික කෘෂිකාර්මික අංශයේ රැකියා අවස්ථා මෙන්ම ආර්ථිකයේ විවිධ අංශවල වැඩිවූ ස්වයං- රැකියා පිළිබඳ සංඛ්‍යාවන්ද ඇතුළත් වන්නේ නැත.

රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරනු ලබන වාර්ෂික සමීක්ෂණයට අනුව, 1979 දී ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල රැකියා ගණන 33,173 කින් වැඩිවූ අතර, 1980 දී එම ප්‍රමාණය වැඩිවූයේ 6,193 කින් පමණි. අර්ධ රාජ්‍ය සංස්ථාවල, 1979 දී ඇති කරන ලද 68,000 ක් වූ නව රැකියා සංඛ්‍යාව සසඳන විට 1980 දී ඇති කරන ලද නව රැකියා ප්‍රමාණය 8,812 ක් විය. සේවක අර්ථසාධක අරමුදලේ වාර්තා වලින් සහ පෞද්ගලික අංශයේ ව්‍යාපාර ආයතන අතුරෙන් තෝරාගත් කිහිපයකින් යුතු නියැදියක් ආශ්‍රයෙන් ද ලබාගත් තාවකාලික දත්තයන්ට අනුව, සංවිධානාත්මක පෞද්ගලික අංශය තුළ නව සේවා නියුක්ති අවස්ථාවන් 3,030 ක් 1980 දී උත්පාදනය වූ බව පෙනී යයි.

ආර්ථිකයේ ප්‍රධාන අංශවල ශ්‍රමය යොදා ගැනීමේ ධාරිතාවය පොදු වශයෙන් පහළ වැටීම 1980 වර්ෂයේ දී, සේවා නියුක්තිය සාපේක්ෂ ලෙස අඩුවෙන් වර්ධනය වීමට ප්‍රධානතම හේතුව ලෙස සැළකිය හැකිය. උදහරණයක් වශයෙන්, 1980 දී වැවිලි අංශයේ වර්ධන අනුපාතය පහළ මට්ටමක පැවති අතර, ඉදිකිරීම් අංශයේ හා වෙළෙඳ කටයුතුවල ඉහත අවුරුදු දෙක තුළ පැවැති අන්දමේ ඉහළ ක්‍රියාකාරිත්වයක් පවත්වා ගැනීමට ද නොහැකි විය. ආයෝජන වර්ධනය කිරීම සඳහා ප්‍රදානය කරන ලද එක්වර ක්ෂය ප්‍රතිභාග දීමනාව වැනි බදු සහනබල යටතේ කර්මාන්ත අංශය ද පෙරට වඩා ප්‍රාග්ධන සූක්ෂම තාක්ෂණය වෙත නැඹුරු වන්නට ඇත. තවද, ආනයන හා විනිමය ලිහිල් කරණයත් සමගම එළඹි මුල් කාලසීමාව තුළ දී දක්නට ලැබුණු ඉහළ සේවා නියුක්ති වර්ධන අනුපාතය, ආර්ථිකයේ ශ්‍රමය යොදා ගැනීමේ ධාරිතාවය පුළුල් නො කළහොත් නො කඩවාම වසරින් වසර පවතී යයි බලාපොරොත්තු විය නො හැකිය.

## මිල

1976 සහ 1977 යන වර්ෂ වලදී සියයට 1 බැගින් ද. 1978 වර්ෂයේදී සියයට 12 කින් සහ 1979 වර්ෂයේදී සියයට 11 කින් ද, වර්ධනය වූ කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය 1980 වර්ෂයේ දී සියයට 26 ක වර්ධනයක් වාර්තා කළේය. තවද 1979 දෙසැම්බර් මාසයට වඩා 1980 දෙසැම්බර් මාසයේදී දර්ශකය සියයට 25 ක වැඩිවීමක් පෙන්වයි. අදාළ මාස සඳහා දර්ශකය 1977 ට වඩා 1978 දී සියයට 17 ක වැඩිවීමක් ද, 1978 ට වඩා 1979 දී සියයට 15 ක වැඩිවීමක් ද පෙන්වීය. මේ අනුව පසුගිය වර්ෂ කිහිපය අතරින් මිල මට්ටමේ වර්ධනයේ වැඩිම වේගය සිදුවී ඇත්තේ 1980 දී බැව් පෙනී යයි.

භාණ්ඩ අනුව විශ්ලේෂණය කිරීමේ දී හෙළිදරව් වනුයේ 1980 වර්ෂය තුළ කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ වර්ධනයෙන් සියයට 46 ක් දේශීය භාණ්ඩයන්ගේ මිල වැඩිවීම නිසාත්, සියයට 52 ක් ආනයනයන්හි මිල වැඩිවීම නිසාත්, ඉතිරි සියයට 2 අපනයන ගණයට අයත් භාණ්ඩයන්ගේ මිල වැඩිවීම නිසාත් සිදුවී ඇති බවය. තවද, සහල්, තිරිඟු පිටි, පාන්, සීනි, කිරිපිටි, භූමිතෙල් සහ බස් ගාස්තුවල ආරෝහන මිල ප්‍රතිශෝධනයන් නිසා දර්ශකයේ වර්ධනයෙන් සියයට 66 ක් සිදු වූ අතර, ඉතිරි ප්‍රමාණය පාලනයට යටත් නොවූ භාණ්ඩයන්ගේ සිදු වූ මිල වැඩිවීමේ බලපෑම පෙන්විය.